# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි දෙවන වසර පරීක්ෂණය

## පළමු සෙමෙස්තරය - 2019

## CMS 2112 - මුද්‍රිත මාධ්‍ය: වාර්තාකරණය සහ සංස්කරණය

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න                    කාලය පැය දෙකයි

---

1. 'ප්‍රවෘත්ති පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික අර්ථකථන මගින් ජනමාධ්‍යවේදයෙහි ප්‍රමුඛ අපේක්ෂා නිරූපණය වෙයි.' මුද්‍රිත මාධ්‍ය කෙරෙහි සාවධාන ව සාකච්ඡා කරන්න.

2. ප්‍රවෘත්තියක අත්‍යවශ්‍යයෙන් අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ කවරේදැයි හඳුන්වා දී පුවත්පත් මාධ්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයත්වය තහවුරු කිරීමට ඒවා උපයෝගී වන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න.

3. මුද්‍රිත මාධ්‍ය වාර්තාකරණයේදී මාධ්‍ය නිදහස, සමාජ වගකීම සහ ප්‍රවෘත්ති කලාවේ ප්‍රමිතීන් ආරක්ෂා කිරීම කෙරෙහි ස්වයං නියාමනය වැදගත් වන ආකාරය පුවත්පත් මාධ්‍ය ආචාරධර්ම සංග්‍රහ උපයෝගී කොට ගනිමින් පැහැදිලි කරන්න.

4. 'ජාතික ආරක්ෂාව පිළිබඳ අවබෝධය හා සංවේදීතාව ගැටුම් වාර්තාකරණයේ අත්‍යවශ්‍ය සංරචකයකි.' ශ්‍රී ලාංකේය මාධ්‍ය නීති කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

   **නැතහොත්**

   ඉලක්කගත ග්‍රාහක කණ්ඩායමක සන්නිවේදන අවශ්‍යතා මුදුන් පමුණුවාලනු පිණිස ක්‍රීඩා පුවත් වාර්තාකරණයේදී ආකර්ෂණීයත්වය හා විචිත්‍රත්වය වෙසෙසින් යොදාගැනෙන ආකාරය විවරණය කරන්න.

*(අනෙක් පිටුවට)*

5. 'ගෝලීය සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණික ප්‍රවණතා මුද්‍රිත මාධ්‍ය කේන්ද්‍රීය වාර්තාකරණය අභිනව දිශානතියකට යොමු කර තිබේ.' සාකච්ඡා කරන්න.

6. පිටපත් සංස්කරණයේ අරමුණු හඳුන්වා දී පුවත්පත් වාර්තාකරණයෙහි ගුණාත්මකභාවය පවත්වා ගැනීම කෙරෙහි සංස්කරණය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

7. 'පාඨකයා ක්ෂණික ව ග්‍රහණය කරගැනීමෙහි ලා ශීර්ෂපාඨ වෙසෙසින් උපස්ථම්භක වෙයි.' යෝග්‍ය උදාහරණ දක්වමින් විමසන්න.